**ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.8 (එ) | ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | 1.6.1 (ආ) |

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂ එකතුව රු.114,722,046 ක් වුවද ණය පාලන ගිණුමේ ශේෂය රු.115,104,660 ක් වුයෙන් රු.382,614 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2014 වර්ෂයේ සිට පැවත එන අත්තිකාරම් 'බී' ගිණුමේ, පාලන ගිණුම සහ කේවල ගිණුම අතර ශේෂ වෙනස 2023 වර්ෂයේ දෙසැම්බර් මාසය වනවිට රු. 382,614 දක්වා අඩු කර ගැනීමට කටයුතු කරන ලදි. ශේෂ අතර වෙනසක් පවතින අතර ක්‍රමිකව එම වෙනස සොයමින් පවතී. ඒ අනුව තවදුරටත් සොයා ගත යුතු ශේෂය රු. 382, 614 ක් බව දන්වා තිබුණි. | කේවල ශේෂ ලේඛනය හා ණය පාලන ගිණුම අතර පවතින මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු. 911,500,000 ක් වූ ඉඩම් සහ රු.138,320,748 ක් වූ ගොඩනැගිලි, 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි දේපළෙහි අයිතිය පවරා ගැනීමේ කටයුතු ද අවසන් කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම්වල අන්තර්ගත වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කිරීම් කර නොමැති බව හඳුනාගත් අතර එම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා තිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br><br>මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් මෙවනතෙක් පවත්වා නොතිබුණු අතර, ඉදිරියේ දී එම ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. |
| (ii) | **පුරාවස්තු පිළිබඳ මධ්‍යගත භාණ්ඩ වට්ටෝරු ලේඛනය**<br><br>මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව පුරාවස්තු පිළිබඳ මධ්‍යගත භාණ්ඩ වට්ටෝරු ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාර 28 සඳහාම පුරාවස්තු පිළිබඳ භාණ්ඩ වට්ටෝරු ලේඛන 28 ක් වෙන් වෙන්ව පවත්වාගෙන යාම සිදුකරනු ලැබේ. එහි සඳහන් තොරතුරු මත පදනම්ව පුරාවස්තු පිළිබඳ මධ්‍යගත භාණ්ඩ වට්ටෝරු ලේඛනය සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව පුරාවස්තු පිළිබඳ මධ්‍යගත භාණ්ඩ වට්ටෝරු ලේඛනය සකස් කිරීමේ කටයුතු අවසන් කර විගණනය වෙත ඉදිරිපත් කල යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1.වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර ගැනීමකින් තොරව 2023 වර්ෂය තුළදී පුරාවිද්‍යා ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල වෙතින් ලැබී පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණු රු.6,210,550 ක මුදලකින් රු.3,934,350 හෙවත් සියයට 63 ක් සමාලෝචිත වර්ෂය තුළ කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ පරිගණක හා උපාංගවල විශාල හිඟයක් පැවති අතර සංරක්ෂණ, නඩත්තු, ගවේෂණ, කැණීම්, ශාස්ත්‍රීය ආදී කිසිදු කටයුත්තක් සඳහා අවශ්‍ය වන ඇස්තමේන්තු පිළියෙළ කිරීම, වාර්තා පිළියෙළ කිරීම වැනි කටයුතු පරිගණක හිඟය නිසා ප්‍රමාද විය. එයට විසඳුමක් වශයෙන් | පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය සඳහා ලැබෙන අරමුදල් අදාළ අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ විශේෂ අනුමැතියක් මත මිලදී ගන්නා ලද බව දන්වා තිබුණි. |

## 2.2. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතෙහි 43 අ (2) වගන්තිය | - | යෝජිත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ හානි ඇගයුම් සමීක්ෂණයන් ව්‍යාපෘතියේ හෝ යෝජනා ක්‍රමයේ අනුග්‍රාහකයින්ගේ වියදමින් කරවීමට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු වුවත්, අදාළ ඉල්ලීම් හෝ අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමකින් තොරව සිදුකර පැවති සංවර්ධන ව්‍යාපෘති 08 ක් පිළිබඳව සොයා බලා අවශ්‍ය | පුරාවිද්‍යා හානි ඇගයුම් සමීක්ෂණ ක්‍රියාදාමය පිළිබඳව 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතේ හා 2000 ඔක්තෝම්බර් 04 දිනැති අංක 1152/14 දරන ගැසට් නිවේදනය මඟින් ප්‍රසිද්ධ කර ඇත.ඒ අනුව අදාළ ආයතනය විසින් සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට මත්තෙන් හානි ඇගයුම් වාර්තාව ලබාගෙන ඉදිරි කටයුතු කළ යුතුය. තවද මේ සම්බන්ධව සියළුම | පුරාවිද්‍යා හානි ඇගයුම් සමීක්ෂණ ක්‍රියාදාමය පිළිබඳව 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතේ හා 2000 ඔක්තෝම්බර් 04 දිනැති අංක 1152/14 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක්‍රියාමාර්ග නොතිබුණි. | ගෙන පළාත් පාලන ආයතන / රාජ්‍ය ආයතන දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | |

**2.4. තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුම් 02 හි වසර 02 ඉක්ම වූ රු.22,742,458 ක තැන්පතු මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | බාහිර පාර්ශව තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීම සඳහා අදාළ පරිත්‍යාග මුදල් ලබා දුන් පාර්ශවයේ කැමැත්ත අකැමැත්ත විමසීම් කිරීම මේ දිනවල සිදු කරනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.5. බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුරාවිද්‍යා පර්යේෂණ හා සංරක්ෂණ කටයුතු වලට පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන ආධාර බැර කිරීම සඳහා වෙනම ගිණුමක් පිහිටුවන ලෙසට 2021 නොවැම්බර් 16 දින ලැබී තිබුණු කැබිනට් අනුමැතිය ප්‍රකාරව, 2022 වර්ෂයේ මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ ජංගම ගිණුමක් විවෘත කර තිබුණ ද, 2024 මාර්තු 28 විගණිත දින වන විටත් දේශීය හෝ විදේශීය පරිත්‍යාගශීලීන්ගෙන් පරිත්‍යාග නොලැබීම හේතුවෙන් ජංගම ගිණුම නිශ්කාර්යව පැවතුණි. | 2024 වර්ෂයේ සිට ගිණුම් මෙහෙයවීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | කැබිනට් අනුමැතිය ප්‍රකාරව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් හා එකඟතා අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) බැංකු ප්‍රකාශනය හා බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.67,168,182 ක් වූ බැංකු ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (viii) හි රු.1,579,237,084 ක් ලෙස රු.1,512,068,902 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2023.12.31 දිනට බැංකු ශේෂය 67,168,182 ක් බව කාරුණිකව සඳහන් කරමි.වැරදීමකින් බැංකු ප්‍රකාශනයේ සඳහන්ව ඇති බැර හා හර සීමාවේ අගය වූ 1,579,237,084 ක මුදල මූල්‍ය ප්‍රකාශනයේ සටහන්ව ඇති බව දන්වා තිබුණි. | බැංකු ගිණුම් පිළිබඳ 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්ව වාර්තාවෙහි බැංකු ප්‍රකාශනය අනුව ශේෂය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1. දැක්ම හා මෙහෙවර

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරාවිද්‍යා ස්ථාන හා රක්ෂිත රැක ගැනීම, සංරක්ෂණය හා නඩත්තු කිරීම, පුරාවිද්‍යා ස්ථානවලට හා ස්මාරකවලට හානි කරන පුද්ගලයන් සම්බන්ධ නීතිමය කටයුතු සිදු කිරීම, රටේ පවතින සියලුම පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධ අනෙකුත් ගැටලු අවධාරණය කර ගැනීම, ගවේෂණ කටයුතු වල ප්‍රගතිය හඳුනා ගැනීම, කාලීනව ලැබෙන පුරාවස්තු ලේඛනගත කිරීම හා ගබඩා කිරීම ආදී ක්‍රියාවලීන් විධිමත් කිරීම ඇතුළුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සියළු කටයුතුවල සාර්ථකත්වය මැන බැලීම සඳහා සියළුම පුරාවිද්‍යා කලාප කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල ප්‍රධාන කාර්යාලය සමඟ ඒකාබද්ධ වන විධිමත් අධීක්ෂණ සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදී නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ සියළු අංශ අධීක්ෂණය කිරීමේ සැලසුමක් මේවනවිට සකස් කරමින් සිටින අතර කඩිනමින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. එමනිසා විගණනය විසින් නිරීක්ෂණය කරන ලද තොරතුරු අධීක්ෂණය කිරීමට අපේක්ෂිත බව දන්වා තිබුණි. | විධිමත් අධීක්ෂණ සැලැස්මකට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදෙන කැණීම් බලපත්‍ර හරහා බාහිර පාර්ශවයන් විසින් හඳුනා ගන්නා ලද පුරාවස්තු දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීමත්, අදාළ කැණීම් වාර්තා ලබාදීමට වසර 04 ක් වැනි දිගුකාලයක් ගතවීමත් හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව සිදු නොවන බවට නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය අවසන් වූ පසු මාස 03ක් ඇතුළත තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන අතර ඒ අනුව හමු වූ පුරාවස්තු පිළිබඳ වාර්තා කිරීමක් සිදුවේ. කැණීමකදී හමුවන පුරාවස්තු තවදුරටත් විශ්ලේෂණය කර පූර්ණ වාර්තාවක් ලබා දීම සඳහා පමණක් වසර 4ක උපරිම කාලයක් ලබා දේ. විධිමත් වාර්තාකරණයෙන් පසු පුරාවස්තු සම්බන්ධ තීරණ ගන්නා බව දන්වා තිබුණි. | කැණීම් වාර්තා නිවැරදි කාල පරිච්ඡේද වලදී ලබා ගැනීමට පසුවිපරම් පැවතිය යුතු බවත්, කැණීම් වලදී සොයා ගන්නා පුරාවස්තු දෙපාර්තමේන්තුව භාරයට ගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් සැකසීමට කටයුතු කළ යුතු වන බව. |
| (ඇ) | ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා වූ පුරාවිද්‍යා නිර්දේශය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 ජූනි 01 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2018 ජූනි 01 දින සිට වාර්ෂිකව ලබාදුන් නමුත්, 2020 මාර්තු 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දිගුකාලීනව නිර්දේශ ලබාදීම | ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා බලපත්‍ර දිගු කාලීනව ලබා දීම කැබිනට් තීරණයක් මත සිදු කෙරුණි.වාර්ෂිකව නිර්දේශ ලබා දීම සඳහා ආදායමට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදු වීම හේතුවෙන් වාර්ෂිකව බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් | ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා පුරාවිද්‍යා නිර්දේශ ලබාදීමේදී පසුවිපරම් කිරීම අත්‍යාවශ්‍ය වීම හා අදාළ අභ්‍යන්තර චක්‍රලේඛ කාලීනව සංශෝධනය කර අවශ්‍ය කොන්දේසි ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් පුරා සාධක පිළිබඳ තොරතුරු අනාවරණය නොවීම මගින් පුරාවස්තුවලට හානි සිදුවිය හැකි වීමත්, කාර්ය මණ්ඩලය හා ප්‍රවාහන පහසුකම් වල ඌනතාවයන් නිසා නැවත පරීක්ෂා කිරීම් සිදු නොවීමත් කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | සැකසීම පිළිබඳ අවධානය යොමු නොකරන ලද බව දන්වා තිබුණි. | |
| (ඇ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ කළුගල් ව්‍යාපෘති 03 කට බලපත්‍ර ලබාදීමට අදාළව 2013 වර්ෂයේදී සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පුරාවිද්‍යා සාධක අනාවරණය කරගත නොහැකි වීමෙන් පුරාවිද්‍යා හානි ඇගයීම් නිර්දේශ ලබාදී කළුගල් කැණීමේ ව්‍යාපෘති සිදුකර පැවති නමුත්, නැවත 2019 වර්ෂයේදී සිදුකළ ස්ථාන පරීක්ෂාවේදී පුරාසාධක අනාවරණය වීම හේතුවෙන් බලපත්‍ර අහෝසි කර තිබුණි. ඒ අනුව නිසි පරීක්ෂා කිරීමකින් තොරව පුරාවිද්‍යා නිර්දේශ ලබාදීම තුළින් වර්ෂ 07 ක පමණ කාලයක් තුළ ගල්බෝර දමා කළු ගල් නිස්සාරණයේදී පුරාවිද්‍යා ස්මාරක වලට හානි සිදුවී තිබුණි. | පළමු ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පාෂාණ මතුපිට හෝ යම් තැනක පසින් වැසී තිබෙන්නට පිළිවන. පුරාවිද්‍යා නිර්දේශ ලබාදෙනුයේ භූමිය මතුපිට දෘශ්‍ය තාව මත පදනම්ව පමණක් වන බැවින් යම් ආකාරයකින් නිර්දේශ ලබා දුන් ස්ථානයක කැණීම් සිදු කිරීමේ දී හෝ නැවත ස්ථාන පරීක්ෂාවක දී සාධක අනාවරණය වීම සිදුවිය හැක. එවන් අවස්ථාවකදී බලපත්‍ර අහෝසි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | අභ්‍යන්තර කාර්ය පරිපාටි හා චක්‍රලේඛ ප්‍රකාරව පසුවිපරම් සඳහා කේෂ්ත්‍ර පරීක්ෂාවන් වල යෙදීමට නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ලබාදීමේ ක්‍රමවේද සකස් කිරීම හා අභ්‍යන්තර චක්‍රලේඛ බලාත්මක කළ යුතුය. |
| (ඉ) | උතුරු පළාතේ බොහෝ පුරාවිද්‍යාත්මක ස්ථානයන්හි මූලික ගවේෂණ කටයුතු පමණක් සිදුකර ඇති අතර, විස්තීර්ණ ගවේෂණයක් මඟින් අදාළ ඉදිරි පුරාවිද්‍යාත්මක කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව යටතේ ඇති තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමේදී උතුරු පළාත ආශ්‍රිත පදිංචි පිරිස් මගින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් බඳවා ගැනීමට නොහැකි වීම මත එම ප්‍රදේශවල රාජකාරී කටයුතු සඳහා අවම කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර ඇත. ඒ සඳහා වෙනත් ප්‍රදේශවල කාර්යමණ්ඩල දිරිගැන්වීමක් ලෙස දුෂ්කර දීමනාවක් ලබාදීම පිළිබඳව විධිමත් වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතින බව දන්වා තිබුණි. | පළාත් 09 ට අදාළ ප්‍රාදේශීය කාර්යාල 15 හරහා පුරාවිද්‍යාත්මක කාර්යයන් පිළිබඳව නිවැරදිව සැලසුම් පිළියෙල කර ඒවා ඉටුකිරීමට ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2010 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ලබාදුන් මූල්‍ය හා තාක්ෂණික සහාය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, මධ්‍යම පරිසර අධිකාරිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අතර ඇති වූ | පිළිතුරු ලබාදී නොතිබුණි. | 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පුරාවිද්‍යා ස්ථානවල අයිතිය |

| | | |
|---|---|---|
| සහයෝගිතා ගිවිසුම ප්‍රකාරව ආරම්භ කළ මූලික ගවේෂණයත් සමඟ 2018 වර්ෂයේදී පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා 2023 ජූලි මාසය වන විට උතුරු පළාතේ හඳුනාගත් 479 ක් වූ සමස්ථ පුරාවිද්‍යා ස්ථානවලින් පුරාවිද්‍යා ස්ථාන 252 ක අයිතිය පවරා ගෙන මායිම් කණු යොදා ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | | පවරාගෙන මායිම් කණු යොදා ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) නාගතාම්බ්‍රාන්, වවුනිකුලම්, සිවපුරම් ශ්‍රීමලේ කෝවිල යන හඳුනාගන්නා ලද පුරාවිද්‍යා නටඹුන් පැවති ස්ථානයන්හි දැනටමත් ස්ථූප ගොඩැලි සම්පූර්ණයෙන්ම පොළොවට සමතලා කොට එම භූමිය තුළ සහ නෙඩුන්කේනි ශිව නගර්, කුලාමුරිප්පු, කොඩ්ඩියාමලෙ යන පුරාවිද්‍යා ස්ථානයන්හි ඇති ස්ථූප ගොඩැලි මත වෙනත් ආගමික ස්ථාන ඉදිකර තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පුරාවස්තු රැක ගැනීම සිදු කළ යුතු අතර, අවශ්‍ය තැන්හිදී ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) උතුරු පළාතේ පිහිටි වෙඩික්කිනාරිමලෙ පුරාවිද්‍යා ස්ථානය, නෙළුක්කුලම, කිඹුලාගල නන්දිමිත්‍රගම පුරාවිද්‍යා පරිශ්‍රයේ ඇති ස්මාරක, නෙඩුන්කේනි ශිවනගර් පුරාවිද්‍යා ස්ථානය, සමලන්කුලම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් සමලන්කුලම පුරාවිද්‍යා ස්ථානය, මාතොට වරාය නගරය සහ 2008 ජූනි 06 දිනැති අංක 1553 දරන ගැසට් පත්‍රය මඟින් ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති තෝනිගල පුරාවිද්‍යාත්මක ස්ථානයද මේ දක්වාම අදාළ මායිම් හඳුනා ගෙන පුරාවිද්‍යා රක්ෂිතයක් හෝ ස්මාරකයක් ලෙසට ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර නොතිබුණි. . | එකඟ වෙමි. | මායිම් හඳුනා ගෙන පුරාවිද්‍යා රක්ෂිතයක් හෝ ස්මාරකයක් ලෙසට ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම් සිදුකර ඉදිරි පුරාවිද්‍යාත්මක කාර්යයන් කාල ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතුය. |
| (එ) කුරුඳුමලේ (කුරින්දි) පුරාවිද්‍යා ස්ථානයේ නටඹුන් බහුලව විසිරී පැවති අක්කර 229 ක භූමිය මැන මාණක සැලසුම් පිළියෙල කර දෙන ලෙසට 2020 නොවැම්බර් සිට අදාළ රාජ්‍ය ආයතන වෙතින් ඉල්ලීම් කර තිබුණ ද, මෙම කාර්යයන් විගණිත දින දක්වා ඉටුවී නොතිබුණි. | එකඟ වන බව. | අදාළ රාජ්‍ය ආයතන හා සම්බන්ධ වී මැනුම් කටයුතු සිදු කරගෙන පුරාවිද්‍යා රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත් කල යුතු බව. |

## 3.2. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 අයවැය ඇස්තමේන්තුව මඟින් දෙපාර්තමේන්තුව සඳහා අත්‍යාවශ්‍ය හා ප්‍රමුඛ ව්‍යාපෘති 170 ක් වෙනුවෙන් රු.මි.161ක ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණ ද, එයින් ව්‍යාපෘති 10 ක භෞතික ප්‍රගතිය සඳහන් කර නොතිබුණු අතර, ව්‍යාපෘති 20 ක භෞතික ප්‍රගතිය සියයට 50 ට වඩා අඩුවෙන් පැවතුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | සැලසුම්සහගතව ප්‍රතිපාදන මුදල් වැය කිරීමට වගබලා ගත යුතුය. |

## 3.3. විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහනුවර රජවාසල හා කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇමරිකා එක්සත් ජනපද රජය විසින් ඇමරිකානු ඩොලර් 265,000 ක් වූ ආසන්න වශයෙන් රු.52,997,350 ක් ලබාදීමට ගිවිසුම්ගත වී තිබුණ ද, ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධන තත්ත්වයන් සලකා බලා ඇමරිකා එක්සත් ජනපද රජය මඟින් ලබාදී තිබුණු මුදල ඇමරිකානු ඩොලර් 156,750 ක් වූ ආසන්න වශයෙන් රු.45,940,561 ක් පමණක් වූ අතර, වසර දෙකක් වූ මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය 2024 අගෝස්තු 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 57 ක් ද, මූල්‍ය ප්‍රගතිය සියයට 21 ක් ද පමණක් වූ අතර, 2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ අක් මුදල් රු.41,879,303 කින් සියයට 63 ක් හෙවත් රු.26,788,750 ක මුදලක් නැවත භාණ්ඩාගාරයට හරවා යවා තිබුණි. දෙපාර්තමේන්තුවේ දුර්වල කළමනාකරණය මේ සඳහා හේතු වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය 2024 අගෝස්තු 31 දින දක්වා දින දීර්ඝ කර ඇත. සංරක්ෂණ කටයුතු සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත්තුවේ තිබූ ගැටළු කිහිපයක් හේතුවෙන් බිල්පත් ගෙවීමට නොහැකි විය. කෙසේවුවද ව්‍යාපෘතිය කල් ඉකුත්වී නොමැති නිසා හරවා යවන ලද මුදල් නැවත භාවිතා කළ හැකි බව දන්වා තිබුණි. | විදේශ ආධාර ලෙස ලැබුණු මුදල් අදාළ අරමුණු ඉටුකර ගැනීමට ප්‍රශස්ථ ලෙස භාවිතා කළ යුතුය. |

## 3.4. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී අක්‍රිය වී 2016 වර්ෂයේදී රු.128,520 ක් වැය කර අළුත්වැඩියා කර තිබුණු GIS ඒකකය වෙත සිතියම් මුද්‍රණය සඳහා මිලදී ගනු ලැබූ HP වර්ගයේ Desing Jet 800 Ps මාදිලියේ ප්ලොටර් මුද්‍රණ යන්ත්‍රය 2023 ජූලි මස වන විටත් තවදුරටත් අක්‍රියව නිශ්කාර්ය තත්ත්වයේ පැවතුණු අතර මෙම යන්ත්‍රය මිලදී ගත් කාලය, වියදම පිළිබඳ නිශ්චිත තොරතුරු සොයා ගැනීම අසීරු බවට වාර්තා කර තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | යන්ත්‍රය සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කර භාවිතා කල හැකි තත්ත්වයේ පවතීද එසේ නොවේ නම් අපහරණය කල යුතුද සම්බන්ධයෙන් තාක්ෂණික වාර්තාවක් ලබාගෙන සුදුසු පියවරයන් අනුගමනය කල යුතුය. |
| (ආ) | GIS ඒකකය සතුව පවතින පුරාවිද්‍යා ස්ථාන වල පිහිටීම ලබා ගැනීම සඳහා යොදා ගන්නා GPS යන්ත්‍ර 05 න් 04 ක්ම ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතීම හේතුවෙන් අදාළ පුරාවිද්‍යා ස්ථාන සඳහා නිවැරදිම GPS ඛාණ්ඩාංක ලබා ගැනීමේ ගැටලුකාරී තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොතිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු වලට ඇතුළත් කර අත්‍යාවශ්‍ය ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වන බව. |
| (ඇ) | දෙපාර්තමේන්තුව සතු වාහන දෙකක් ධාවනය කිරීමට නොහැකි බවට 2022 නොවැම්බර් 21 හා 2023 අගෝස්තු 28 දිනයන්හිදී යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ ලබාදී තිබියදී 2024 මැයි 31 විගණිත දිනය දක්වාත් අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු නොකර ගාල් කර තිබුණි. අදාළ වාහන දෙක ධාවනය කළ නොහැකි බවට රියදුරන් විසින් 2021 නොවැම්බර් 17 දින හා 2022 සැප්තැම්බර් 27 දින දන්වා තිබුණි. තවද වාහන 2 සඳහා යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ ලබා දීමටද පිළිවෙලින් වසර 01 ක් සහ මාස 11 ක කාලයක් ප්‍රමාද කර තිබීම හා ආවරණයක් රහිතව ගාල්කර තිබීම හේතුවෙන් නියමිත පිරිවැය | වාහන දෙක අලුත්වැඩියාව සඳහා මිල ගණන් ලැබී ඇති අතර යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ පදනම්ව අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට නියමිත බවත්, වාහන වර්ෂා ජලයෙන් ආරක්ෂා කිරීම සඳහා විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි ආවරණයක් නඩත්තු අංශය මඟින් ඉදිකරවා ගැනීමට නියමිතව ඇති බවත් දන්වා තිබුණි. | කඩිනමින් අළුත්වැඩියා කටයුතු නිමකර ධාවන තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතු බව. |

ඉක්මවා වියදම් දැරීමට සිදුවන බවට නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (ඇ) 2018 ඔක්තෝබර් 09 දින මධ්‍යම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයට අයත් ඩබල් කැබ් රථයේ සිදු වූ අනතුර සම්බන්ධයෙන් විත්තිකරු වූ එම රථයෙහි රියදුරුට රු.46,500 ක දඩ මුදලක් නියම කර තිබුණ ද, රථයට සිදු වූ අලාභය වූ රු.5,882,769 ක් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමටත් වසර 05 කට අධික කාලයක් තිස්සේ කැබ් රථය අළුත්වැඩියා කිරීමටත් කටයුතු කර නොතිබුණි. | මධ්‍යම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයට අනුයුක්ත කර තිබූ **PG 4006** ඩබල් කැබ් රථයේ අනතුර සම්බන්ධයෙන් එහි රියදුරු විත්තිකරු වූ අතර ඔහු මේ වනවිට සේවයෙන් පහකර ඇත. එහි මු.රෙ.**104(4)** පරීක්ෂණය සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර එහි නිර්දේශ ලද පසු ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.මෙම රථයේ අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවා ඇති අතර ඒ සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් ඇති බව දන්වා තිබුණි. | අලාභයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 3.5. පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 සැප්තැම්බර් 18 දින සිට 2023 ජූලි 19 දක්වා හදිසි අනතුරු වලට භාජනය වූ දෙපාර්තමේන්තුවේ රථ වාහන 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (1) ප්‍රකාරව විධිමත් පරීක්ෂණ සිදු කර අලාභය තක්සේරු කර වගකිව යුත්තන් හඳුනා ගැනීමටත්, මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පාඩු හා හානි ලේඛනයට ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. තවද, 2023 අප්‍රේල් 12 සිට නොවැම්බර් 18 දක්වා කාලය තුළ හදිසි අනතුරු වලට භාජනය වූ රථ වාහන 06 ක රු.274,000 ක් වූ මුළු අලාභය මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් කර වගකිව යුතු අයගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | 2018 වසරේ සිට 2022 දක්වා රථ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104 (4) ප්‍රකාරව නියමිත පරිදි කටයුතු කර නොතිබුණු නමුත් 2023 වසරේ සිදු වූ රථ වාහන අනතුරු වෙනුවෙන් මු.රෙ. 104 (4) පරීක්ෂණ සඳහා නිලධාරීන් පත්කර ඇත. එක් වාහන අනතුරකට අදාළව මු.රෙ. පරීක්ෂණ වාර්තාව මේ වනවිට ලැබී ඇති අතර එමඟින් ලබා දී ඇති නිර්දේශ පදනම්ව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. සෙසු අනතුරු සඳහා පත් කර ඇති පරීක්ෂණ නිලධාරීන් කමිටු වෙත කඩිනමින් වාර්තා ලබාදෙන ලෙසට දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 3.6. කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වවුනියාවේ රංකෙත්ගම ගල නම් ස්ථානයේ හා මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් වමලන්කුලම රක්ෂිතයෙන් වටවී පැවති වමලන්කුලම නම් ස්ථානයේ ඛනිජ හා පාෂාණ නිස්සාරණ සඳහා පුරාවිද්‍යා නිර්දේශ ලබාදීමේ ලිපියේ සඳහන් කොන්දේසි වලට අනුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශේෂ අනුමැතියක් ලබා නොගෙන අඩි 50 ක පමණ විශාල ගැඹුරකට ගල් කඩා ඉවත් කර අතහැර දමා පැවති ස්ථාන ජලයෙන් පිරී පැවතුණු නමුත්, ඊට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, රංකෙත්ගම යෝජිත ස්ථානය හා ඒ අවට මීටර් 50 ක ප්‍රදේශයක් තුළ පොළොව මතුපිට පමණක් පාදක කරගනිමින් සිදුකර පැවති නිරීක්ෂණ මත ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක සාධක දක්නට නොලැබුණු බව නිගමන හා යෝජනා වල සඳහන් කර තිබුණ ද, යාබඳ ගල්තලාවෙහි පුරා සාධක පැවති බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. | ඛනිජ නිස්සාරණයේදී යම්කිසි ස්ථානයකට බලපත්‍ර ලබාදීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් අදාළ ස්ථානය පරීක්ෂා කර මතුපිට පුරාවිද්‍යා සාධක නොමැති නම් නිර්දේශ ලබාදීම සිදුකරනු ලබයි. මේ සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ භූ විද්‍යා පතල් කාර්යාංශය මගින් වන අතර එකී බලපත්‍රයේ කොන්දේසි කඩ කිරීමේදී ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීම අදාළ ආයතනයට පවරා ඇති බව දන්වා තිබුණි. | නිසි අධ්‍යයනයකින් යුතුව පුරාවිද්‍යා නිර්දේශ ලබාදීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | තෝනිගල පුරාවිද්‍යාත්මක ස්ථානය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමේ අරමුණින් අත්‍යාවශ්‍ය ඉදිකිරීම් සඳහා වූ 2022 ස්ථානීය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි. | එම අවස්ථාවේ දී ආයතනය මුහුණ දුන් මූල්‍ය අර්බුදය නිසා මෙම කාර්ය සිදු කිරීමට නොහැකි අතර ඉදිරි කාලයේදී අවශ්‍ය ප්‍රතිපාදන ලැබුණු විගස එම කාර්ය සිදු කිරීමට අපේක්ෂිත බව දන්වා තිබුණි. | පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක රැක ගැනීමට සැලසුම් සහගතව කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ශිලා මංජුසා වර්ගයට අයත් මහාශිලා සුසාන භූමියක් වන අක්කර 26 ක පමණ ප්‍රදේශයක පුරාවිද්‍යා නටඹුන් විසිරී පැවති මාමඩුව මූල ඓතිහාසික සොහොන් බිම පුරාවිද්‍යා ස්ථානය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යා නිර්දේශ ලබා ගැනීමෙන් තොරව වනවගා කටයුතු කිරීම හේතුවෙන් පුරාසාධකවලට හානි සිදුවී පැවති අතර, දැඩි ලෙස හානි වීමෙන් | එකඟ වෙමි. | පැවති භූමියේ ස්වරූපයට බලපෑමක් සිදු කිරීමේදී පුරාවිද්‍යා නිර්දේශ ලබාගත යුතු බව සියලු රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන නිලධාරීන් දැනුවත් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | අනතුරුව 2022 ජූලි 28 දින අංක 2290/33 දරන ගැසට් පත්‍රය මගින් පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණි. | | |
| (ඇ) | පෘතුග්‍රීසින් විසින් ඉදිකර පසුව ලන්දේසින් විසින් ප්‍රතිසංස්කරණය කර ඇති බවට මූලාශ්‍ර සාධක පවතින මන්නාරම් දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අරිප්පු නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ මුක්කරිපුත්තුරය ග්‍රාමයේ පිහිටා ඇති හෙක්ටයාර 0.4465 ක භූමි ප්‍රදේශයක් පුරා විසිරී ඇති අරිප්පු බලකොටුව 2013 අගෝස්තු 16 දිනැති අංක 1823/73 දරන ගැසට් පත්‍රය මගින් පැරණි / ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති නමුත්, විගණිත දින දක්වාත් කිසිදු පුරාවිද්‍යාත්මක කාර්යයක් සිදුකර නොතිබුණි. | එකඟ වන බව. | පනත, ගැසට් නිවේදන, අභ්‍යන්තර කාර්ය පරිපාටි හා අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව පුරාවිද්‍යා භූමීන් ආරක්ෂා කළ යුතු බව. |
| (ඉ) | මන්නාරම් දිස්ත්‍රික්කයේ නානට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුරුංකන් ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මුරුංකන් රෝහල් භූමියේ පිහිටා ඇති දිගින් සෙ.මී. 160 ක් හා පළලින් සෙ.මී 61 ක් වූ පුවරු ලිපිය ක්‍රි.ව. 2-3 සියවස් වලට අයත් යැයි සැලකෙන අතර, එහි ගෙවී ගොස් ඇති අපරබ්‍රාහ්මීය අක්ෂර දක්නට ලැබෙන පුවරු ලිපිය 2014 ජූනි 20 දිනැති අංක 1868 දරන ගැසට් පත්‍රය මගින් පැරණි/ ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති නමුත්, රෝහල් සේවකයන් විසින් එය අසුන් ගැනීම සඳහා භාවිතා කිරීම හේතුවෙන් අනාරක්ෂිතව අක්ෂර මැකී ගොස් පැවති බවට නිරීක්ෂණය විය. | මේ වනවිට අභිලේඛන හා නාණක විද්‍යා අංශය මගින් සෙල්ලිපිය ආරක්ෂා කිරීම සඳහා **2024** වර්ෂයේදී ආරක්ෂිත වැටක් සහ නාම පුවරුවක් සවි කිරීමට කටයුතු කරමින් තිබෙන බව දන්වා තිබුණි. | පනත මගින් ලබාදී ඇති ප්‍රතිපාදන ප්‍රකාරව පුරාවිද්‍යා ස්මාරක රැක ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඊ) | කන්දරෝඩෙ (කඳුරුගොඩ) පුරාවිද්‍යා ස්ථානයේ කුඩා ස්තූප පවතින පරිශ්‍රයෙහි වැසි වතුර පිරී යාම හේතුවෙන් හායනයට ලක්වන සංරක්ෂිත ස්තූප කොටස් සහිත පරිශ්‍රයේ වැසි වතුර බැස යාමට නළ පද්ධතියක් එළීම සඳහා 2016 වර්ෂයේදී ඉදිරිපත් කළ රු.534,150 ක ඇස්තමේන්තුව මත රු.67,000 ක මුදලක් වැය කරමින් | ප්‍රාදේශීය ලේකම් අවසරය මත තල්ගස් **08**ක් කපා ඉවත් කර ඇති අතර වතුර බැසීමට හියුම් පයිප්ප යෙදීම සඳහා කටයුතු කිරීමේදී ගොවි ජනතාවගෙන් එල්ල වූ විරෝධතාවය මත එම කාර්යය සිදුකළ නොහැකි වූ බව දන්වා තිබුණි. | පනත මගින් ලබාදී ඇති ප්‍රතිපාදන ප්‍රකාරව පුරාවිද්‍යා ස්මාරක හා පුරාවිද්‍යා ස්ථාන රැක ගැනීමට කටයුතු කළ යුතු බව හා බාධාකාරී කටයුතු පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කළ යුතු වන බව. |

| | | | |
|---|---|---|---|
| | මිලදීගෙන තිබූ හියුම් පයිප්ප නිශ්කාර්යයව පරිශ්‍රයේ ගොඩ ගසා තිබුණි. | | |
| (උ) | බාහිර පාර්ශවයන් වෙත කැණීම් බලපත්‍ර නිකුත් කිරීම යටතේ 2023 ජූනි 30 දිනට ලැබිය යුතු අවසන් ශාස්ත්‍රීය වාර්තා සංඛ්‍යාව 53 ක් වූ අතර, එයින් වසර 10 ඉක්මවූ කැණීම් බලපත්‍ර සංඛ්‍යාව 07 ක් සහ වසර 05 ඉක්මවූ කැණීම් බලපත්‍ර සංඛ්‍යාව 15 ක් විය. | වාර්තා ලබා නොදුන් අය සඳහා වාර්තා ලබාදෙන මෙන් සිහිකැඳවීම් යවා ඇති අතර සිහිකැඳවීම් යවා මේ වනතෙක් වාර්තා ලබා නොදී ඇති අය සඳහා බලපත්‍ර ලබාදීම අත් හිටුවා ඇති බව දන්වා තිබුණි. | කැණීම් වාර්තා ලබා ගැනීම කඩිනමින් සිදුකළ යුතු වන බව. |
| (ඌ) | කැණීම් කාර්ය පටිපාටියේ 6.1.3 වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව යටතේ පවතින පුරාවිද්‍යා කෞතුකාගාර 13 ක කෞතුක භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමටත්, කැණීම් කාර්ය පටිපාටියේ 7.1 වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා වාර්ෂික පාලන වාර්තාව පිළියෙල කිරීමටත් කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී වාර්තා ලබා නොදුන් කෞතුකාගාර වෙත කෞතුක භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබාදෙන ලෙස සිහිකැඳවීම් ලිපි යොමු කර 2022 වර්ෂයට අදාළ සමීක්ෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, 2022 වර්ෂයට අදාළව පාලන වාර්තා වල තොරතුරු ලබා දීමට සෘජුව මැදිහත් විය යුත්තේ ප්‍රාමාණික දැනුමක් පවතින කැණීම් අධ්‍යක්ෂවරයෙක් හෝ සහකාර අධ්‍යක්ෂවරයෙක් වියයුතු බැවින් එම තනතුරු පුරප්පාඩුව පවතින බැවින් එම වාර්තා නිසිලෙස ලබාදීම දුෂ්කරව පවතී. නමුත් 2022 වර්ෂයට අදාළව ප්‍රාදේශීයව ලබාගෙන කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | දෙපාර්තමේන්තුව තුළ සිටින ප්‍රාමාණික දැනුමක් සහිත නිලධාරීන් සහභාගී කරවාගෙන වාර්ෂික පාලන වාර්තාව පිළියෙල කිරීම සිදු කළ යුතු බව. |
| (එ) | ස්ථාවර නියෝගයේ සඳහන් කැණීම් මාර්ගෝපදේශ 03 හි 16 වන වගන්තිය සහ කැණීම් කාර්ය පටිපාටියේ 2.1.2.2 වගන්තිය ප්‍රකාරව, පසුගිය කැණීම් වාර්තා සම්පූර්ණ නොකරන ලද පුද්ගලයෙකුට කැණීම් කටයුතු සඳහා නැවත නව බලපත්‍රයක් නිකුත් නොකළ යුතු වුවද, පසුගිය කැණීම් වාර්තා ලබා නොදුන් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මහාචාර්යවරුන් දෙදෙනෙකුට නැවත කැණීම් බලපත්‍ර නිකුත් කර තිබූ අතර 2006 සිට 2017 දක්වා කැණීම් බලපත්‍ර 08 කට අවසාන ශාස්ත්‍රීය වාර්තා ඉදිරිපත් කර නොමැති නමුත් 2022 දක්වා නව කැණීම් බලපත්‍ර 14 ක් ද නිකුත් කර තිබුණි. එසේම ථූපාරාම පිළිමගෙය, විජයරාම | වාර්තා ලබා දී නොමැති මහාචාර්යවරු සඳහා සිහිකැඳවීම් ලිපි නිකුත් කර ඇත. බලපත්‍ර ලබාදීම සහ වාර්තා ලබා ගැනීම විධිමත් කිරීම සඳහා පුරාවිද්‍යා උපදේශන සභාවේ උපදෙස් මත විද්වත් කමිටුවක් මත කමිටුවේ නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | ථූපාරාම පිළිමගෙය, විජයරාම පිළිමගෙය හා කිරිබත්වෙහෙර යන ස්ථාන කැණීම් සඳහා ලබාදුන් බලපත්‍ර යටතේ ලද නිරීක්ෂණ ඇතුළත් වාර්තා හා කැණීමෙන් ලද පුරාවස්තු වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත අත්පත් කර ගැනීම හා ඉදිරි පුරාවිද්‍යාත්මක කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සහාය කරගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | පිළිමගෙය හා කිරිබත්වෙහෙර යන ස්ථාන කැණීම් සඳහා ලබාදුන් බලපත්‍ර යටතේ වාර්තා භාරදීමේ කාලයද ඉකුත් වී තිබුණි. | | |
| (ඒ) | කැනීම් කාර්ය පටිපාටියේ 02 වන වගන්තිය ප්‍රකාරව චංචල පුරාවස්තු ලේඛනගත කිරීම සඳහා ක්‍රමවත් සමීක්ෂණයක් සිදුකර පුරාවස්තු හඳුනා ගැනීම, මහජන ප්‍රදර්ශනය සඳහා යොමු කිරීම හෝ වෙනත් විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු නොකිරීම මත බොහෝ පුරාවස්තු කාලීනව විනාශ වෙමින් පැවති බව නිරීක්ෂණය වූ අතර, දෙපාර්තමේන්තු කැණීම්, අනවසර කැණීම් හා මහජන ආධාර යටතේ හඳුනාගත් පුරාවස්තු විශාල ප්‍රමාණයක් හම්බන්තොට හා කෑගල්ල පුරාවිද්‍යා කාර්යාල පරිශ්‍ර තුළ ගොඩ ගසා තිබුණි. | චංචල පුරාවස්තු හඳුනා ගැනීම සහ ලේඛන ගත කිරීමට අදාළ ක්‍රියාවලිය මේ වනවිට වේගවත් කර සිදුකර ඇති බව දන්වා තිබුණි. | චංචල පුරාවස්තු හඳුනා ගැනීම සහ ලේඛනගත කිරීම කඩිනම් කල යුතුය. |
| (ඔ) | කාර්ය පටිපාටි සංග්‍රහයේ වගන්ති අංක 1.2.22 ප්‍රකාරව 2020 වර්ෂයෙන් පසුව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ ගවේෂණ ව්‍යාපෘති 18 ක් සඳහා ගවේෂණ වාර්තා ලබාදී ඇති නමුත්, භූගෝලීය දත්ත සැකසුම් (GIS) ඒකකය වෙත රැස්කරගත් දත්ත ලබා දීමට කටයුතු කර නොතිබුණි. | භූගෝලීය ස්ථාන නිර්ණය කරන (GPS) උපකරණ හිඟය මත මෙම අඩුපාඩුව සිදු වී ඇති අතර 2024 වර්ෂයේ GPS උපකරණ මිලදී ගෙන කඩිනමින් කාර්යය සිදුකිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | භූගෝලීය දත්ත සැකසුම් (GIS) ඒකකයට ගවේෂණ වාර්තා ලබාදී කටයුතු කඩිනමින් නිම කළ යුතු වන බව. |
| (ඕ) | දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂය දක්වා හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව 5,664 ක් විය. ඒ අතරින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය තුළ ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර තිබූ සමස්ථ පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව 2,958 ක් වූ අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුළ ඇතුළත් භූ අවකාශීය දත්ත ගොනුවට ඇතුළත් කර තිබූ පුරාවිද්‍යා ස්ථාන ගණන 1,758 ක් විය. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට හඳුනාගත් සමස්ථ පුරාවිද්‍යා ස්ථාන වලින් සියයට 48 ක් ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර නොතිබූ අතර, සියයට 69 ක භූගෝලීය ස්ථාන ක්‍රමාංකන දත්ත ලබාගෙන ඒවා භූ අවකාශීය දත්ත ගොනුවට ඇතුළත් කර නොතිබුණි. | මෙම කාර්යය වේගවත්ව සිදුකිරීම සඳහා අවශ්‍ය උපකරණ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත නොතිබීම ප්‍රධාන වශයෙන් ම බලපා ඇති අතර ඒවා කඩිනමින් ලබා ගැනීමට කටයුතු සිදුකර ඇති අතර, ඒ සඳහා ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන් පුහුණු කිරීමද සිදුකර අවසන්ව පවතින බව දන්වා තිබුණි. | භූගෝලීය ස්ථාන ක්‍රමාංකන දත්ත ලබාගෙන ඒවා භූ අවකාශීය දත්ත ගොනුවට ඇතුළත් කිරීමට අත්‍යාවශ්‍ය මූලධන උපකරණ ප්‍රසම්පාදනය සිදු කිරීම හා නිලධාරීන් පුහුණු කර අවශ්‍ය කාර්යසාධන දර්ශකයන් ලඟා කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ක) | යාන්ඔය වාරිමාර්ග ජලාශ ව්‍යාපෘතියේ, පුරාවිද්‍යා හානි ඇගයීම් සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා 2017 පෙබරවාරි 14 දින පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර පැවති මුදලින් රු.2,105,152 ක මුදලක් තවදුරටත් පොදු තැන්පත් ගිණුම තුළ රඳවාගෙන පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොතිබුණි. | පුරාවිද්‍යා හානි ඇගයීම් සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජකයන් විසින් දෙපාර්තමේන්තුව වෙත තැන්පත් කරන මුදල් සම්බන්ධව පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ග) | දීඝවාපී දාගැබ ප්‍රතිනිර්මාණය කිරීමේ කාර්යය සඳහා Rotatable arched template එකක් රු.4,147,400 කට නිෂ්පාදනය කරවා ගැනීම පිණිස රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට රු.2,239,596 ක අත්තිකාරම් මුදලක් 2020 අගෝස්තු 25 දින ලබාදී, පසුව එම කාර්යය ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එය මිනුම් උපකරණ මඟින් මිනුම් ලබා ගැනීමේ ක්‍රමවේදය අනුව සිදු කිරීමට තීරණය කර තිබුණි. ගෙවා ඇති අත්තිකාරම් මුදලින් සකස් කර පැවති යකඩ කොටස්, චෛත්‍ය ඉදිකිරීමෙන් පසු අවශ්‍ය නඩත්තු කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි ගලවා ඉවත් කළ හැකි තරප්පු පෙළක් නිම කිරීම සඳහා භාවිතා කිරීමට යෝජනා කර තිබුණත්, ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | රු.2,239,596 ක අත්තිකාරම් මුදලක් රජයේ කර්මාන්තශාලාව වෙත ලබාදී වර්ෂ 04 කට ආසන්න කාලයක් ගතවී පැවති නමුත්, එම අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව ඉහළ කළමනාකරීත්වය වගකීමෙන් කටයුතු කළ යුතු බව හා කඩිනමින් අත්තිකාරම් පියවා ගැනීමට පියවර ගත යුතු බව. |
| (ච) | රජය විසින් වාර්ෂිකව නඩත්තු වියදම් දරමින් A, B, C ලෙස ශ්‍රේණි වර්ගීකරණය යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා කෞතුකාගාර 28 ක් පවත්වාගෙන යනු ලැබුව ද, ඉන් ත්‍රිකුණාමලය සමුද්‍ර හා නාවික ඉතිහාස කෞතුකාගාරය මඟින් පමණක් ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීමත්, අනෙකුත් කෞතුකාගාර නරඹන්නන්ගෙන් ගාස්තු අය නොකිරීමත් නිසා ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන A, B, C වර්ගීකරණය යටතේ ඇති කෞතුකාගාර 28 සම්බන්ධව පොදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය යුතු බව. |
| (ජ) | මිනිසාගේ අතීතය සොයා, හෙළ ජනයාගේ දේශීය ආහාර රටාව, මානව විද්‍යාව, අපේ හෙළයෝ ගලින් කළ විස්කම්, බිතු සිතුවම් සංරක්ෂණය, සුළු නොවන සුළු කලා යන ග්‍රන්ථ පිටපත් 2,000 ක් බැගින් ද, පුරාවිද්‍යා ස්ථාන | දෙපාර්තමේන්තුවේ පොත් මුද්‍රණය කරනු ලබන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තු පොත් අලෙවිසැළ අමාත්‍යාංශයේ පොත් අලෙවිසැළ සහ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය පදනම් කරගෙනය. පසුගිය වර්ෂයේ | 12,380 ක් වන මුද්‍රිත ග්‍රන්ථ සංඛ්‍යාව සහ ඊට පෙර මුද්‍රණය කර ගබඩා තුළ තැන්පත් කර ඇති පොත් පරිශීලකයන්ට මිලදීගත හැකි අවස්ථා සම්පාදනය කිරීම කෙරෙහි |

| | | | |
|---|---|---|---|
| | නාමාවලිය රත්නපුර ග්‍රන්ථයෙන් පිටපත් 1,000 ක් සහ Proceeding of the National Archeology Symposium යන ග්‍රන්ථයෙන් පිටපත් 100 ක් 2023 දෙසැම්බර් මස රු.3,732,210 ක් ගෙවා මුද්‍රණය කරවාගෙන තිබුණු අතර ප්‍රතිපාදිත මුදල ඉක්මවීම මත ඒ සඳහා රු.1,632,210 ක සැලසුම් කළ ව්‍යාපෘති 02 ක් යටපත් කර තිබුණි. මෙලෙස මුද්‍රණය කරන ලද පොත් අලෙවි කිරීමට හෝ බෙදාහැරීමට නිසි සැලසුම් සහගත වැඩපිළිවෙලක් නොමැති වීම හේතුවෙන් ග්‍රන්ථ 12,380 ක් පමණ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ සවිකර ඇති කන්ටේනර් බහාලුම් දෙකෙහි නිශ්කාර්යව ගබඩා කර පැවති බවට 2024 මාර්තු 27 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය සඳහා සහභාගීවීමට රාජ්‍ය ආයතන වලට නොහැකිවීම මත අපේක්ෂිත තොග විකුණුමක් ළඟා කරගැනීමට නොහැකි විය. ඉදිරි වර්ෂවල පොත් මුද්‍රණයේදී මෙම කරුණු සළකා බලා අවම තොගයක් පවතින ලෙස මුද්‍රණ කටයුතු සැලසුම් කරන බව දන්වා තිබුණි. | අවධානය යොමු කල යුතුය. |
| (ට) | 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධන පනතින් සංශෝධනය වූ 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ 46 (1) වගන්තිය අනුව නීති විරෝධී ලෙස ප්‍රයෝජනයට ගත් පුරාවස්තු ආරක්ෂා කිරීමේ හෝ තොරතුරු සපයන්නන්ට සහ ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට තෑගි දීමේ කාර්යය සඳහා පුරාවස්තු තෑගි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව නීති විරෝධී කාර්යයන් වලක්වා ගැනීමට සිදු කරන දායකත්වය වෙනුවෙන් දිරි ගැන්වීමක් ලෙස මූල්‍යමය දායකත්වය ලබා දීමේ අරමුණින් මෙම අරමුදල ඇති කල යුතු වුවද, නීති කෙටුම්පත් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විටත් අරමුදල පිහිටුවීම සිදු නොකිරීම තුල සමාලෝචිත වර්ෂය තුළ අයකර ඇති රු.130,479,050 ක් වූ අධිකරණ දඩ මුදලින් අඩක්, පුරාවිද්‍යා තෑගි අරමුදලට බැර කොට නියමිත කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | තෑගි අරමුදලේ ප්‍රතිශත බෙදී යාම සම්බන්ධයෙන් ගැටළුසහගත තත්ත්වයන් මතු වී ඇති අතර 2024 අප්‍රේල් 05 දින මේ සම්බන්ධයෙන් සකස් කළ කෙටුම්පතක් නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇත. පසුවිපරම් කිරීම තුලින් කඩිනමින් කටයුතු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | අවශ්‍ය සහායන් ලබාදී පනතෙහි අදාළ වගන්ති සංශෝධන කටයුතු කඩිනමින් අවසන් කළ යුතු බව. |
| (ඩ) | ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා පුරාවිද්‍යා නිර්දේශය ලබාදීමේදී අය කෙරෙන ගාස්තු 2019 පෙබරවාරි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.10,000 | රු. 10,000 ක් වූ ගාස්තුව රු.25,000 දක්වා සංශෝධනයට කෙටුම්පත් ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | අදාළ සංශෝධනයන් සිදු කිරීම සඳහා ඉදිරිපත් කර පැවති කෙටුම්පත පිළිබඳව පසු විපරම් සිදුකර ඉදිරි |

| | | | |
|---|---|---|---|
| | ක් ලෙස සංශෝධනය කර එම ගාස්තුව ඉදිරියේදී වර්ෂ 03 කට වරක් සංශෝධනය කළ යුතු බවට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 පෙබරවාරි 28 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබාදී තිබුණු අතර 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (II) කොටසෙහි ඡේද අංක 05 ප්‍රකාරව වසර 03 කට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව ගාස්තු සංශෝධනය කළ යුතු විය. එසේ වුවද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඒ ආකාරයට ගාස්තුව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබීමෙන් රජයට අයවිය යුතු ආදායම් අහිමි වී තිබුණි. දෙපාර්තමේන්තුව විසින් තාවකාලිකව බදු දී ඇති මාතර මහනගර සීමාව තුළ පිහිටි නුපේ පැරණි ඕලන්ද වෙළඳපොළ ගොඩනැඟිලි සංකීර්ණය සඳහා ද චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු නොකර රු.5,000 ක ප්‍රමාණවත් නොවන ගාස්තුවකට බදු දී තිබුණි. | | කටයුතු කළ යුතු බව. |
| (ණ) | 2009, 2010 හා 2012 වර්ෂ වලදී බුලත්සිංහල පාහියංගල ප්‍රාග් ඓතිහාසික කැණීම් ව්‍යාපෘතිය සහ 2013 වර්ෂයේ කිතුල්ගල බෙලිලෙන කැණීම් ව්‍යාපෘතිය මඟින් අනාවරණය කරගත් පුරාවිද්‍යාත්මක තොරතුරු සහ සාධක විද්‍යානුකූල විශ්ලේෂණ කටයුතු සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට රැගෙන යාමට 2017 මැයි 08 දින කථිකාචාර්යවරයෙකු විසින් භාරගත් බවට සාක්ෂි පැවති අතර, එම පර්යේෂණ කටයුතු අවසන් කිරීමෙන් පසු එම පුරාවස්තු නැවත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | පාහියන්ගල ප්‍රාග් ඓතිහාසික කැණීමෙන් හමු වූ මානව අස්ථි කොටස් රසායනාගාර පහසුකම් යටතේ ඉතා ආරක්ෂාකාරීව තැබීම සිදුකළ යුතුය. ඒ සඳහා ප්‍රමාණවත් පහසුකම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු නොවන බැවින්, අස්ථි කොටස් විධිමත් පරිසරයක ආරක්ෂාකාරීව තැබීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය වෙත භාර දී තිබුණි. ඒ තුළින් සාමාන්‍ය ජනයාට ප්‍රදර්ශනය කිරීමකට වඩා පර්යේෂණ කටයුතු සිදුකරන විද්‍යාර්ථයන්ගේ ශාස්ත්‍රීය අධ්‍යයන හා පර්යේෂණ සඳහා වඩාත් ඵලදායී ලෙස යොදාගැනීම මූලික අරමුණ වී ඇති බව දන්වා තිබුණි. | පුරාවස්තු ආරක්ෂාවට නිසි පියවර ගත යුතු වීම. |
| (ත) | 2023 අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම මඟින් භූගත මහලේ ජලකාන්දුවට පිළියම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කරගෙන තිබුණු රු.15,000,000 ක ප්‍රතිපාදනයෙන් මූලික | 2023 අයවැය හා ක්‍රියාකාරී සැලැස්ම අනුව භූගත මහලේ ජල කාන්දුව වැළැක්වීම සඳහා මුදල් වෙන් කර තිබූ නමුත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය | රාජ්‍ය මුදල් වැය කිරීමේදී විචක්ෂණශීලීව ක්‍රියා කළ යුතු බව. |

| | | |
|---|---|---|
| වාර්තාව සැකසීම ආදී කටයුතු සඳහා පමණක් රු.2,146,736 ක් වැයකර තිබීමෙන් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 77 ක් ප්‍රයෝජනයට නොගෙන ඒ වෙනුවට අක්‍රිය වී ඇති අභ්‍යන්තර දුරකථන පද්ධතිය නැවත සකස් කිරීම පිණිස රු.3,000,000 ක නව ව්‍යාපෘතියක් ආදේශ කර තිබුණු අතර, සංශෝධිත සැලැස්ම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත නොකිරීම මත එම කාර්යය ද ඉටුකර නොතිබුණි. | (NBRO) එයට අදාළ වාර්තාව ලබා දෙන ලද්දේ 2023 නොවැම්බර් 15 දිනය. එම වාර්තාවේ තිබූ සංකීර්ණ ඉංජිනේරුමය කාර්යයන් නොවැම්බර් මස අග වන විට ක්‍රියාත්මක කිරීමට නොහැකි වන බැවින් අදාල මුදල අභ්‍යන්තර දුරකථන පද්ධතිය නැවත සවි කිරීම පිණිස නව ව්‍යාපෘතියක් ලෙස ඉදිරිපත් කල ද කාර්යය ඉටුකිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින් එය අමාත්‍යාංශය මඟින් අනුමත කර නොතිබුණු බව දන්වා තිබුණි. | |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 4,317 ක් වූ අනුමත සමස්ථ කාර්ය මණ්ඩලයෙන් 1,660 ක් හෙවත් සියයට 38 ක් පුරප්පාඩු වූ අතර, ඒ තුළ වසර 15 කට වැඩි කාලයක් පුරප්පාඩු වී පවතින දෙපාර්තමේන්තුවට පමණක් ආවේණික වූ ශාස්ත්‍රීය කටයුතු සඳහා විධායක මට්ටමේ අධ්‍යක්ෂ තනතුරු 07 ක් ද, දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර ද ඇතුළත් විය. | 2024 මාර්තු 31 දින විට පුරප්පාඩු සංඛ්‍යාව 1576 දක්වා අඩුකර ගැනීමට කටයුතු කර ඇති අතර එය අනුමත තනතුරු ගණනින් සියයට 36.5 කි. මීට අමතරව කාර්මික තනතුරු 25 ක්, කාර්මික (නිලධාරි සංරක්ෂණ සහකාර) තනතුරු 14 ක් බඳවා ගැනීමටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර එම බඳවා ගැනීම් සම්බන්ධ කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී. විධායක මට්ටමේ අධ්‍යක්ෂ තනතුරු 07ක් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අවස්ථා ගණනාවකදී ඉල්ලීම් ඉදිරිපත් කර ඇති මුත් ඒ සඳහා අනුමැතිය නොලැබීම මත බඳවා ගැනීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු පිරවීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) දෙපාර්තමේන්තුව සඳහා අනුමත සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව 250 ක් වුවද, 2023 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුතු තත්‍ය සංඛ්‍යාව 285 ක් වූයෙන් 35 දෙනෙකුගෙන් අතිරික්තයක් පැවති අතර, අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ ඔවුන් ඒකාබද්ධ සේවාව සඳහා නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 මාර්තු 31 දින විට අතිරික්ත සංවර්ධන නිලධාරී තනතුරු ගණන 29 දක්වා අඩු වී ඇත. මෙම අතිරික්ත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව අනුමත කර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අවස්ථා ගණනකදීම ඉල්ලීම් ඉදිරිපත් කර ඇති මුත් ඒ සඳහා අනුමැතිය නොලැබී ඇත. දෙපාර්තමේන්තුව සඳහා අනුමත කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 44 ක් පුරප්පාඩු බැවින් එම තනතුරුවල රාජකාරී උක්ත නිලධාරීන් මඟින් ඉටුකර ගැනීමට සිදු වී ඇති බව දන්වා තිබුණි. | අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ අතිරික්ත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව ඒකාබද්ධ සේවාව සඳහා නිදහස් කිරීමට කටයුතු කළ යුතු වන බව. |
| (ඇ) පුරාවිද්‍යා සහායක තනතුර සඳහා 688 දෙනෙකු, මුරකරු තනතුරු සඳහා 201 දෙනෙකු හා රියදුරු තනතුර සඳහා දෙදෙනෙකු වශයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා 2023 වර්ෂයේදී බඳවාගත් බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක පුහුණුලාභීන් ප්‍රාදේශීය කාර්යාල සඳහා යෝජිත සැලසුම්ගත සංඛ්‍යාවට වඩා වැඩියෙන් සේවා අවශ්‍යතාවය නොසලකා අනුයුක්ත කර තිබුණු බවට නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ පැවති පුරාවිද්‍යා සහායක හා මුරකරු තනතුරුවල සමස්ත පුරප්පාඩු ගණන සලකා සියලු ප්‍රාදේශීය කාර්යාලවලට බෙදී යන අයුරින් අනුයුක්ත කිරීම් සිදු කරන ලදී. එහෙත් බහුකාර්ය සහායකයින් බඳවා ගැනීමේ දී එකඟ වී ඇති කරුණු පදනම්ව ඔවුන් පදිංචි දිස්ත්‍රික්කයේ හෝ ඔවුන්ට පහසුවෙන් ළඟා විය හැකි දිස්ත්‍රික්කයකට අනුයුක්ත කරන ලෙසට අමාත්‍යාංශය වෙතින් ලද උපදෙස් පදනම්ව පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි අදාළ අනුයුක්ත කිරීම් සිදු කරන ලද බව දන්වා තිබුණි. | කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීමේදී සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතු වන බව. |